දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA


මගේ අංකය )
எனது இல ) MH/FS/01/2015/ (ලීපි)
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2015.02.02
Date )


# සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதாரம் மற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health & Indigenous Medicine

ආයතන චක්‍රලේඛ අංක : 01 / 01 / 2015

අතිරේක ලේකම්වරුන් / සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන ගණකාධිකාරී
සියලුම ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් / නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්
සියලුම අධ්‍යක්ෂවරුන් / සහකාර ලේකම්වරුන්
සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන් / ආයතන ප්‍රධානීන්
සියලුම අංශ ප්‍රධානීන්

**<u>අතිගරු ජනාධිපතිතුමාගේ දින 100 වැඩපිළිවෙළ යටතේ සෞඛ්‍ය සේවය තුළ මනා රෝගී සත්කාර සේවාවක් මහජනතාව වෙත සැපයීම තහවුරු කිරීම</u>**

අතිගරු ජනාධිපතිතුමාගේ දින 100 වැඩපිළිවෙළ යටතේ රජයේ රෝහල්වලින් මහජනතාවට ලබාදෙන රෝගී සත්කාරක සේවාවන් නිසි පරිදි ලබාදෙන්නේද යන්න දැඩිව පරීක්ෂා කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය සැලසුම් කර ඇත.

රජයේ රෝහල් සම්බන්ධයෙන් බහුල වශයෙන් දක්නට ලැබෙන පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඔබගේ පෞද්ගලික අවධානය යොමු කර පවත්නා තත්ත්වයන් වඩා නිවැරදිව හා කාර්යක්ෂම කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් කාරුණිකව දැනුම් දෙමි.

- ❖ ආයතන සංග්‍රහය / මුදල් රෙගුලාසි / රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ / ජනාධිපති චක්‍රලේඛ ඇතුළුව සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත් කොට ඇති චක්‍රලේඛණවලට අනුකූලව රාජකාරි කටයුතු සිදුකිරීම හා සිදුවන බවට වගබලා ගැනීම.

- ❖ රෝහල් කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම නිසි ලෙස සටහන් කිරීම.

- ❖ රාජකාරි වේලාව තුළ සේවා ස්ථානයේ රැඳී සිටීම.

- ❖ රෝහල් කාර්ය මණ්ඩලය රාජකාරි වේලාවන්හිදී පෞද්ගලික සේවයේ යෙදීම සඳහා ඇති අවකාශ වළක්වාලීම.

- ❖ නියමිත නිල ඇඳුම් ඇඳීම සඳහා කාර්ය මණ්ඩලය යොමු කිරීම.
- ❖ රාජකාරි ලිපිලේඛන නිසි ලෙස නඩත්තු කිරීම.
- ❖ රජයේ සම්පත් නිසි ලෙස නඩත්තු කිරීම.
- ❖ රෝගී සත්කාර සේවාව ලබාදිය යුතු ස්ථානයන් නිසි ලෙස විවෘත කර / පවත්වා ගෙනයාම.

එසේම ඉදිරි මාස 03 ඇතුළත සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවත්නා සියලුම ආයතන හදිසි වැටලීම් අංශයේ පරීක්ෂණ කණ්ඩායම් මගින් අධීක්ෂණය කිරීමට කටයුතු යොදා ඇති බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

ආචාර්ය ඩී. එම්. ආර්. බී. දිසානායක
ලේකම්
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ආචාර්ය ඩී.එම්.ආර්.බී. දිසානායක
ලේකම්
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

| | | | | |
|---|---|---|---|---|
| පිටපත් - | 1. | ගරු සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමා | - | කාරුණික දැනගැනීම සඳහා |
| | 2. | ගරු සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය හසන් අලි මැතිතුමා | - | |
| | 3. | ජනාධිපති ලේකම් | - | |
| | 4. | රාජ්‍ය පරිපාලන,පළාත් සභා,පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් | - | |
| | 5. | සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් | - | |
| | 6. | සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් | - | කාරුණික දැන ගැනිම සඳහා සහ ඉදිරි කටයුතු සඳහා. |